**හැටන් - දික්ඔය නගර සභාව - 2020**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

හැටන් - දික්ඔය නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වාදුන් රු.10,928,153 ක ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වසරේ ගිණුමෙන් ගලපන බව දන්වා ඇත. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළයුතු වීම. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති අවිනිශ්චිත ගිණුමේ රු.2,202,806 ක ශේෂය ශේෂ පත්‍ර සටහන්වල ආරම්භක ශේෂය ලෙස දක්වා නොතිබුණි. | වසර මුල ආරම්භක ශේෂ සියල්ල අදාළ ලේජර්වල ආරම්භක ශේෂ ලෙස සටහන් කරනු ලබන බව දන්වා ඇත. | ආරම්භක ශේෂයන් නිවැරදිව සටහන් කළ යුතු වීම. |
| (ඇ) | 2017 වර්ෂයේ මිලදී ගැනීමට අපේක්ෂා කළ නමුත් මිලදී නොගත් භාණ්ඩ වෙනුවෙන් ණයහිමියන් ලෙස ගිණුම්ගත කළ රු.2,628,650 ක ශේෂ 04 ක් සඳහා ගිණුම්වල ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ ණය හිමි ලේඛනයෙන් ඉවත් කිරීමට පියවර ගනු ලබන බව | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළයුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.5,095,189 ක් හා උපලේඛන / වාර්තා අනුව වටිනාකම රු.4,962,777 ක් වුයෙන් රු.132,412 ක වෙනසක් විය. | උපලේඛනවල සටහන් කිරීම් කිහිපයක් මඟ හැරීම නිසා මෙම තත්ත්වය ඇති වූ බවත්, ඉදිරියේදී නිවැරදි කර ගන්නා බවත්, දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන සහ අනුරූපී වාර්තා සසඳා බලා අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.7,337,302ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් හා පොදු ගබඩා ලේඛනය යාවත්කාලීන කිරීමෙන් පසු මෙය සඳහා උපලේඛන සපයන බව දන්වා ඇත. | විගණනය සඳහා සියලු සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371(5) | කාර්ය නිමකළ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවද, 1987 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසයක සිට පවත්නා එකතුව රු.507,868 ක් වූ අත්තිකාරම 2021 ඔක්තෝබර් 31 දක්වාත් පියවීමට කටයුතු කර නොතිබුණි. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,190,887 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 40,374,088 ක්විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු | | |
| | 2020 ජනවාරි 01 දින හිඟ වරිපනම් බදු රු.9,154,702 ක් වුවද, වර්ෂය තුළ අයවී තිබුණේ රු.1,195,948 ක් විය. ඒ අනුව ආදායම් පරීක්ෂක නිළධාරීන්ගේ කාර්යභාරය නිසි ලෙස ඉටු වී නොතිබුණි. | අය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | නගර සභා නීති ප්‍රකාරව හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** | **කුලී** | | |
| | රු.1,581,710 ක් වූ තානායම් කුලියෙන් කිසිදු මුදලක් 2021 ඔක්තෝබර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | ලිපියක් යොමු කර එම මුදල ගෙවන ලෙස දන්වා ඇත. | නගර සභා ආඥා පනත අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | **මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.15,000,000 න් රු.5,694,900 ක මුදලක් පමණක් 2021 ඔක්තෝබර් 31 දක්වා ලැබී තිබුණෙන්, රු.9,305,100 ක මුදලක් තවදුරටත් අයකරගත යුතුව පැවතුණි. | හිඟව පවතින මුදල් ලබා ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| I. | 2005 වර්ෂයේදි සභාව විසින් ඉදිකර පවත්වාගෙන යන ලද දික්ඔය ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කටයුතු නවත්වා දමා තිබූ අතර කිසිදු සභා අනුමැතියකින් තොරව එහි ග්‍රාමනිලධාරි කාර්යාලයක් පවත්වාගෙන ගොස් තිබුණි. මේ හේතුවෙන් එම ප්‍රදේශයේ රෝගී ප්‍රතිකාර සේවය ඇනහිට තිබුණි. | 2021 ඔක්තෝබර් 31 දිනය වනවිට ආයුර්වේද බෙහෙත් ශාලාව නැවත භාරයට ගෙන අළුත්වැඩියා කරමින් පවතින බවත්, ඉදිරියේදී රෝගී ප්‍රතිකාර සඳහා යෙදවීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇත. | සේවා ආරම්භ කිරීමට පියවර ගත යුතු වීම |
| II. | 2020 වර්ෂයේ සභාව තුළ අනවසර ඉදිකිරීම් 15 ක් හඳුනාගෙන තිබුණි. ඉන් 02 කට පමණක් අනුමැතිය ලබා දී තිබූ අතර නඩු පවරා තිබුණි. ඉතිරි ඉදිකිරීම් සඳහා විගණිත දින වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනුමත කිරිමට නොහැකි ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග නොපමාව ගත යුතු වීම |
| III. | 2017,2018 සහ 2019 වර්ෂවල සිට පැවත එන එකතුව රු.3,747,430 ක් වූ ණයහිමි ශේෂ 33 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය හැකි ගාස්තු ගෙවීමටත් පොත් වලින් ඉවත් කිරීමට ඇති ඒවා තහවුරු කර ඉවත් කිරීමටත් පියවර ගන්නා බව දන්වා ඇත . | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට පියවරගත යුතු වීම |
| IV. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 08 සිට වසර 12 දක්වා කාල පරාසයක් ගතවී තිබූ රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු එකතුව රු.9,985,139 ක් වූ ගිණුම් ශේෂ 03 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| V. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 09 දක්වා කාල පරාසයක් ගතවී තිබූ එකතුව රු.4,416,477 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | ඉටුකළ කර්මාන්ත සඳහා වියදම් ප්‍රතිපූර්ණය වූ වහාම ගෙවා නිම කරන බව දන්වා ඇත . | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ඉඩම් දීර්ඝකාලීනව බදු දීමේදී අවස්ථා 84 කට අදාළව නගර සභා ආඥා පනතේ 36(ඉ)(II) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වර්තමානයේ මෙවැනි ආකාරයේ කටයුතු විධිමත් ක්‍රමවේදයට සිදු වෙමින් පවතින බව දන්වා ඇත. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| I. | 2015 වර්ෂයේදී මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන ප්‍රවාහන විදුලි බල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශයේ ප්‍රතිපාදන රු.1,964,375 කින් වැය කර ඉදිකර තිබුණු ජීව වායු නිෂ්පාදන ව්‍යාපෘතිය නිසි අධ්‍යනයකින් තොරව ඉදිකර තිබීම හේතුවෙන් ඉදිකළ දින සිටම නිෂ්ක්‍රීයව පැවතුණි. | පසුව පිළිතුරු සපයන බව දන්වා ඇත. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වීම |
| II. | වාර්ෂික ටෙන්ඩර් මත බදු දිය හැකිව තිබූ ඩන්බාර් ක්‍රිඩාංගනය අසළ කායවර්ධන මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේදී බදු දී නොතිබීම නිසා ඌන උපයෝජිතව පැවතුණි. | ලංසු කැඳවූවත් ඒ සඳහා ලංසුවක් ඉදිරිපත් නොවූ බව දන්වා ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම |
| III. | දීර්ඝ කාලයක සිට හැටන් දික්ඔය නගර සභාවේ ගබඩාව තුළ හා E – Net piyasa තුළ වු රු.1,000,000 කට අධික වටිනාකමකින් යුතු භාණ්ඩ අයිතම 28 ක් වසර 05 සිට වසර 14 ක කාලයක් නිෂ්ක්‍රීයව හා භාවිතයෙන් තොරව පැවතුණි. | වෙන් ලින්ක් රෝලය අවශ්‍ය විටෙක භාවිතය වෙනුවෙන් ලබාදෙනු ලැබේ පරිගණක කාර්යාලීය භාවිතය වෙනුවෙන් ලබාදී ඇති බවත් ඉතිරිව තිබෙන භාණ්ඩ ඉල්ලන අවස්ථාවක ලබාදෙනු ලබන බව දන්වා ඇත. | වත්කම් උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිජ්රාපුර ඉර්ෆාම් නිවාස ආසන්නයේ පඩිපෙළ සංවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ රු 250,661 ක මුදලකට 2020 පෙබරවාරි 24 දින ගිවිසුම් ගතවී තිබූ අතර, ඉටුකළ වැඩ වටිනාකම රු.154,741 ක් විය. මෙහිදී පඩිපෙලක කොන්ක්‍රීට් ඝනකම 200 mm හෝ 150 mm ලෙස ගෙවීම් කර තිබුණද විගණනයෙන් පරීක්ෂා කිරීමේදී ඝනකම 31 mm හා 60 mm ප්‍රමාණයේ ඉතා අවම මට්ටමක පැවතුණි. මේ අනුව පඩිපලේ පැවැත්ම ගැටළුකාරී බැවින් ගෙවූ රු.88,606 මුදලම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | පවතින අධික කාර්යභාරය තුල කර්මාන්ත තාක්ෂණ නිළධාරිගේ පූර්ණ අධීක්ෂණ යටතේ සිදුකිරීමට නොහැකි වූ බවත් මුදල අඩුකර ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. | නොපමාව ඇස්තමේන්තු ප්‍රකාරව කර්මාන්ත නිම කරවා ගත යුතු වීම |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පරිසර කළමනාකරණය** | | |
| බලපත්‍ර අළුත්කළ යුතු ව්‍යාපාර 22 ක බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා මාස 08 සිට අවුරුදු 10 දක්වා කාලයක් ගත වී තිබුණි. | අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව දන්වා ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| **(ආ) කසල කළමනාකරණය** | | |
| i. කසල කළමනාකරණය පිළිබඳව විධිමත් වැඩ පිළිවෙලක් හා දිගුකාලීන / කෙටිකාලීන සැලැස්මක් නගර සභාව විසින් සකස් කර නොතිබුණි . | ඉදිරියේදී මෙම කටයුත්ත විධිමත් කිරීමට අදාළ පියවර ගෙන ඇති බව දන්වා ඇත. | විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතු වීම. |
| ii. හැටන් නගරය ජල මූලාශ්‍ර ආරම්භක ස්ථාන පවතින ප්‍රදේශයක් වන අතර එම ජල මූලාශ්‍ර ආරම්භයේදීම අපවිත්‍ර වන ආකාරයෙන් කසල බැහැර කර ඇති ස්ථාන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව ජලය භාවිතා කරන මහජනතාව වෙත අපවිත්‍ර ජලය ලබාදීමක් සිදු වී තිබුණි. | අවිධිමත්ව කසළ බැහැර කරන මහජනතාවට අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | නගර සභා නිලධාරීන් වගකිව යුතු ලෙස තම රාජකාරි ඉටුකළ යුතු වීම |